සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

පළමු වාර පරීක්ෂණය **2018** | 6 ශ්‍රේණිය
முதலாம் தவணைப் பரீட்சை **2018** | தரம் 6
First Term Test **2018** | Grade 6

විද්‍යාව / விஞ்ஞானம் / Science } I | පැය දෙකයි / இரண்டு மணித்தியாலம் / Two Hour

සැළකිය යුතුයි.
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමි වේ.
(ii) නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

---

01. ක්ෂුද්‍ර ජීවීන් නිරීක්ෂණය සඳහා සිසුන් ලබා ගත් පහත නියැදි වලින් අඩුම ක්ෂුද්‍ර ජීවීන් ප්‍රමාණයක් ඇත්තේ.

(1) පිදුරු පල් කළ ජලය (2) පොකුණක ජලය (3)මී පැණි (4) පොල් වතුර

02. ශාකවලට ආහාර නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය ශක්තිය සපයනුයේ,

(1)ක්ෂුද්‍ර ජීවීන් (2)සූර්යයා (3) චන්ද්‍රයා (4) මිනිසා

03. අජීවී පරිසරයක් හා සම්බන්ධ සංසිද්ධියක් වන්නේ.

(1) පැටවුන් බිහි කිරීම (2) මල් පිපීම
(3)කුරුල්ලන් පියාඹීම (4)භූමිකම්පාවක් ඇතිවීම.

04. චලන දැක්විය හැකි නමුත් සංචරණය කළ නොහැකි ජීවියා වන්නේ,

(1)පළගැටියා. (2)මුහුදු මල. (3)හංගොල්ලා. (4)ගැඩවිලා.

05. කාබන්ඩයොක්සයිඩ් වායුව හඳුනා ගැනීමට විද්‍යාගාරයේ දී භාවිත කළ හැකි ද්‍රව්‍යයකි.

(1)හුණු දියර (2)පොල්තෙල් (3)ජලය (4)මද්‍යසාර

06. පහත දැක්වෙන්න ද්‍රව්‍ය සලකන්න,.

(a) පළතුරු බීම
(b) හුණු කැට
(c)L.P. ගෑස්

ඉහත ද්‍රව්‍ය ඝන, ද්‍රව, වායු අනුපිළිවෙලින් සකස් කළ විට ලැබෙන පිළිතුර වන්නේ.

(1) b, c, a . (2)c, a, b . (3)a, b, c . (4)b, a, c .

07. ජීවිත කාලය පුරාම වර්ධනය වන ජීවියකු වන්නේ.

(1)ගවයා (2)බල්ලා
(3)අඹ ගස (4)වවුලා

08. එළදෙනකු විසින් පැටවකු බිහි කිරීම හා සිංහයා සතෙකු ආහාරයට ගැනීම පිළිවෙලින් ජීවින් සතු ලක්ෂණ ලෙස ගත් විට.

(1) ප්‍රජනනය හා වර්ධනය වේ. (2)වර්ධනය හා චලනය වේ.

(3) පෝෂණය හා ප්‍රජනනය වේ. (4)ප්‍රජනනය හා පෝෂණය වේ.

09. පහත ජීවීන්ගෙන් වැඩි ජීවීන් ගණනකගේ සංචරණ ක්‍රමය වන්නේ.



(1)පියෑඹීම. (2)බඩගා යෑම.

(3)පිහිනීම. (4)පැන පැන යෑම.

10. වස්තුවක අඩංගු පදාර්ථ ප්‍රමාණය හැඳින්වීමට සුදුසුම වනුයේ පහත සඳහන් කුමක්ද?

(1)පරිමාව (2)බර (3)ස්කන්ධය (4)සාන්ද්‍රණය

11. රූපයේ දැක්වෙන ආකාරයට මීටර් කෝදුවක වාතය පිරවූ බැලුම් පුරවා සමබර කර එක් බැලුමක් පුපුරවා හරින ලදී.




එම ක්‍රියාකාරකම මගින් පෙන්වන්නේ,

(1) වායු වලට නිශ්චිත පරිමාවක් ඇති බවයි.

(2) වාතය අවකාශයේ ඉඩක් ගන්නා බවයි.

(3) වායු, අඩංගු භාජනයේ හැඩය ගන්නා බවයි.

(4) වාතයට ස්කන්ධයක් ඇති බවයි.

12. ඝන, ද්‍රව, වායු යනුවෙන් පදාර්ථය වර්ග කළ හැක්කේ ඒවායේ ................. අනුවයි.

(1)දෘඪ බව. (2)ස්වභාවය. (3)භෞතික අවස්ථාව. (4)ගඳ සුවඳ.

13. ප්‍රත්‍යාස්ථ බව පවතින ද්‍රව්‍යයක් වන්නේ.

(1)තඹ. (2)රබර්. (3)රත්තරන්. (4)වීදුරු.

14.දහනය සඳහා භාවිතා වන ද්‍රව්‍යයක් නොවන්නේ.

(1)භූමි තෙල් (2) දර (3)කාබන්ඩයොක්සයිඩ් (4) ස්ප්‍රීත්තු

15. අඩංගු භාජනයේ හැඩය ගන්නා "ද්‍රව්‍යය" තෝරන්න.

(1) පොත (2) ලී කැබැල්ල (3) ගඩොල (4)පෙට්‍රල්

16. ශිෂ්‍යයෙක් පාසල් ගෙන යන වතුර බෝතලයකට අයිස් කැට කීපයක් එකතු කරන ලදි. ටික වේලාවකින් බෝතලයේ පිට පැත්තේ ජල බිංදු තැන්පත් වී තිබෙනු දැකිය හැකි විය. ඊට හේතුව විය හැක්කේ,

(1) බෝතලය සිදුරු වී තිබීම.

(2) බෝතලය වැස්සට තෙමීම.

(3) වායුගෝලීය ජල වාෂ්ප සීතල මතුපිට මත ජලය බවට පත් වී තැන්පත් වීම.

(4) බෝතලයේ වතුර පිටතට ගලාගෙන ඒම.

17. ද්‍රව පරිමාවක් මැන ගැනීමට භාවිත කරන උපකරණය වන්නේ,

(1)මිනුම් සරාව (2)මීටරය (3) අන්වීක්ෂය (4)අත්කාචය

18. පෘථිවියේ පවතින පරිභෝජනයට ගත හැකි ජලය ප්‍රතිශතය වනුයේ,

(1)10% (2)1% (3)0.1% (4)0.01%

19. ජලයේ ඝන අවස්ථාවක් නොවන්නේ,
(1)පිනි (2)හිම (3)ග්ලැසියර් (4)අයිස්

20. හොඳ විද්‍යුත් සන්නායක ද්‍රව්‍යයක් වනුයේ,

(1)වීදුරු (2)ප්ලාස්ටික් (3)තඹ (4)රබර්

## IIකොටස

පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.

01) (A) පහත ප්‍රකාශය නිවැරදි නම් ඉදිරියේ ඇති වරහන තුළ (✓) ලකුණද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

| | | |
|---|---|---|
| (i) | පරිසරය යනු අප හැර අපේ වටාපිටාවයි. | ( ) |
| (ii) | අප අවට ඇති දේ පදර්ථ හා ශක්ති ලෙස ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකිය. | ( ) |
| (iii) | පරිසරයේ පවතින්නේ ජීවී සහ අජීවී දෑ පමණි. | ( ) |
| (iv) | වර්ධනය, පෝෂණය, අවකාශයේ ඉඩක් ගැනීම ජීවී ලක්ෂණ වේ. | ( ) |
| (v) | කලපු තුළ මිරිදිය අඩංගු වේ. | ( ) |
| (vi) | සංයුක්ත ආලෝක අණ්වීක්ෂය ක්‍රියා කරන්නේ විදුලියෙනි. | ( ) |
| (vii) | ජලය ඝන, ද්‍රව, වායු යන අවස්ථා තුනේම දැකිය හැකිය. | ( ) |
| (viii) | සතුන්ට මෙන්, ශාකවලට සංචරණය කළනොහැකිය. | ( ) |

(B) සුදුසු වචනය යා කරන්න.

| | | |
|---|---|---|
| (i) | භංගුර ද්‍රව්‍යයකි. | වර්ධනය |
| (ii) | ජීවී ලක්ෂණයකි. | කිරල |
| (iii) | මුහුදු ජලය | කාබන්ඩයොක්සයිඩ් |
| (iv) | තම ආහාර තමා විසින්ම නිපදවාගන්නා ජීවීන් | වීදුරු |
| (v) | කඩොලාන ශාකයකි. | ධ්වනි ශක්තිය |
| (vi) | ජලජ ශාකයකි. | ස්වයංපෝෂී |
| (vii) | ශාකවල ආහාර නිපදවීමට අවශ්‍ය වේ. | කරදිය |
| (viii) | ස්කන්ධයක් රහිත අවකාශයේ ඉඩක් නොගන්නා දෙයකි. | හයිඩ්‍රිල්ලා (ලකුණු 1 x 16) |

02. වරහන් තුළ ඇති නිවැරදි වචනය තෝරා ඡේදයේ හිස්තැන් පුරවන්න.

(ස්වයංපෝෂී, පෝෂණය, ජලය, ඔක්සිජන් වායුව, සූර්යාලෝක ශක්තිය, ප්‍රභාසංශ්ලේෂණය, විෂමපෝෂීන්, ශ්වසනය, සංචරණය, නිදිකුම්බා, කාබන්ඩයොක්සයිඩ්,)

ශාක තමන්ට අවශ්‍යය ආහාර නිපදවා ගන්නේ(i) .................................. මගිනි. ඒ සඳහා අමුද්‍රව්‍ය ලෙස පසෙන් ලබා ගන්නා(ii)............................ත් වායුගෝලයෙන් ලබා ගන්නා(iii)............................... වායුවත් යොදා ගනී. ශක්ති ප්‍රභවය ලෙස යොදා ගන්නේ(iv)...........................................වේ. මෙහිදී අතුරු ඵලයක් ලෙස(v).................................. පිටවේ. එම නිසා ශාක (vi).................................. ජීවීන් ලෙස හඳුන්වයි. ශාක වල නිපදවන ආහාරසතුන් විසින් ආහාරය සඳහා ගැනීම(vii)............................ ලෙස හඳුන්වයි. ශාක නිපදවන ආහාර මත සතුන් ඍජුව මහෝවක්‍රවහෝයැපේ.මේ නිසා සතුන් (viii)...........................ලෙස හඳුන්වයි. ආහාර මගින් සතුන්ට ශක්තියක් ලැබෙන අතර එම ක්‍රියාවලිය(ix)............................... ලෙස හඳුන්වයි. ශක්තිය යොදා ගනිමින් සතුන් තැනින් තැනට ගමන් කිරීම(x)............................... ලෙස හඳුන්වයි. ශාක ද චලන දක්වන අතර ඒ සඳහා උදාහරණ ලෙස(xi).......................... ශාකය දැක්විය හැකිය.

(ලකුණු 11)

03. අප අවට පරිසරයෙ ද්‍රව්‍ය හා ශක්තීන් බොහෝ ප්‍රමාණයක් පවතී. ඒවා අපට සංවේදී වන විවිධ ක්‍රම පවතී.

i. පරිසරය නිරීක්ෂණය කිරීමට විවිධ ඉන්ද්‍රියන් උපකාරී වේ. ඒ අනුව පහත වගුව පුරවන්න.

| ඉන්ද්‍රිය | සංවේදනය |
|---|---|
| a. ………………………………… | ආලෝකය, වර්ණ |
| b. ………………………………… | ස්පර්ශය |
| c. ………………………………… | ධ්වනිය |
| d. ………………………………… | රස |
| නාසය | e. ………………………………… |

(ලකුණු 05)

ii. නිරීක්ෂණ ලබා ගැනීමට විවිධ උපකරණ උදව් වෙයි. එම උපකරණ පිළිබඳ ව නිවැරදි භාවිතය සොයා දෙපස ගලපන්න.

| | |
|---|---|
| (1) උෂ්ණත්වමානය | (a) කුඩා අකුරු විශාල කර බැලීම |
| (2) දුරේක්ෂය | (b) උණුසුම් හෝ සීතල මැන ගැනීම |
| (3) ප්‍රිස්ම දෙනෙතිය | (c) වසතුවක ස්කන්ධය මැනීම |
| (4) අත් කාචය | (d) ක්ෂුද්‍ර ජීවීන් නිරීක්ෂණය |
| (5) තරාදිය | (e) ක්‍රීඩා තරගයක් හොඳින් නැරඹීම |
| (6) අණ්වීක්ෂය | (f) වල්ගාතරු කඩා වැටීම නැරඹීම (ලකුණු 06) |

04). ජීවීන් වර්ගීකරණය සඳහා දෙබඳුම් සූචි භාවිතා කරයි.

i) දී ඇති ජීවීන්ට අනුව පහත දී ඇති දෙබඳුම් සම්පූර්ණ කරන්න. (ලකුණු 04)




ii) අප අවට පරිසරයේ ඇති ප්‍රධාන ජීවී කාණ්ඩ තුන නම් කරන්න. (ලකුණු 03)

iii) වගුව පිළිතුරු පත්‍රයේ පිටපත් කරසුදුසු ලක්ෂණ යොදා ගනිමින් පහත වගුව සම්පූර්ණ කරන්න.(ලකුණු 03)

| පදාර්ථයේ අවස්ථා | හැඩය | පරිමාව |
|---|---|---|
| a)………………………….... | නිශ්චිත හැඩයක් ඇත. | b)………………………….... |
| c)………………………….... | නිශ්චිත හැඩයක් නැත. | d)………………………….... |
| e)………………………….... | f)………………………….... | නිශ්චිත පරිමාවක් නැත. |

iv) රබර් පටියක් සතු සුවිශේෂී ගුණාංගය කුමක් ද? (ලකුණු 01)

(05).ජලය ලෝකයේ වැදගත් සම්පතකි. එම නිසා ජල සම්පත සුරකීම ඉතා වැදගත් කරුණකි.

i) ජීවයේ පැවැත්ම සඳහා ජලයේ වැදගත් කම් දෙකක් ලියන්න. (ලකුණු 02)

ii) මිනිස් ක්‍රියාකාරකම් නිසා ජලය දූෂණය වන ආකාර දෙකක් ලියන්න. (ලකුණු 02)

iii)ජලය පවතින භෞතික අවස්ථා තුන දක්වන්න. (ලකුණු 03)

iv) මිරිදිය පවතින ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

v) කරදිය පවතින ස්ථාන දෙකක් නම් කරන්න . (ලකුණු 02)

(06).ශාක ලෝකයේ හා සත්ත්ව ලෝකයේ පවතින විවිධත්වයන් පිළිබඳ පහත ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

i) පත්‍රය පත්‍රිකා ලෙස බෙදී ඇති ශාක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii) පත්‍ර අග්‍රයේතුඩක් ඇති ශාක සඳහා උදාහරණ දෙකක් ලියන්න. (ලකුණු 02)

iii) ශාක චලන දක්වන ශාක සඳහා උදාහරණ තුනක් ලියන්න. (ලකුණු 03)

iv) සංචරණය කළ නොහැකි මුත් විවිධ චලන පමණක් පෙන්වන සතුන්දෙදෙනෙක් ලියන්න. (ලකුණු 02)

v) විෂමපෝෂී හා ස්වයංපෝෂී ජීවීන් සඳහා උදාහරණ එක බැගින් දක්වන්න. (ලකුණු 02)